ප්‍රතිපෝෂණ කාර්ය පත්‍රිකා 02

# ක්‍රිස්තියානි ධර්මය



නිපුණතා මට්ටම 1 : 2 - 3

අ.පො.ස (සාමාන්‍ය පෙළ) උපකාරක කාර්ය පත්‍රිකා

ආගමික හා සාරධර්ම ශාඛාව

අධ්‍යාපන අමාත්‍යංශය

ඉසුරුපාය

බත්තරමුල්ල

**ක්‍රිස්තියානි ධර්මය**

**ආදර්ශ ප්‍රශ්න පත්‍රය 2**

1. ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය නම් කරන්න.

---------------------------------------------------------------------------------------------------

2. දේව රාජ්‍යය අන්‍යයන් සඳහාද විවෘතව පවතින බව ජේසුස් වහන්සේ කළ ප්‍රකාශය ලියන්න.

---------------------------------------------------------------------------------------------------

3. නාසරෙත් ධර්ම ශාලාවේ දී ජේසුස් වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබූ ජනතාවට පැවසූ ප්‍රස්තා පිරුළු දෙක ලියන්න.

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

4. ගලීල මුහුද හඳුන්වන වෙනත් නම් සඳහන් කරන්න.

---------------------------------------------------------------------------------------------------

5. ජේසුස් වහන්සේ මුල් ගෝලයන් කැඳ වූ ස්ථානය හා ඔවුන් නම් කරන්න.

---------------------------------------------------------------------------------------------------

6. 'ප්‍රේරිත' යන්නෙහි අර්ථය ලියන්න.

---------------------------------------------------------------------------------------------------

7. ශ්‍රාවකයන් සැත්තෑ දෙනා හා දොළොස් දෙනා පිටත් කර යැවීමේ දී ඔවුන්ට පැවරූ කාර්යයන් ලියන්න.

---------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

8. ජේසුස් වහන්සේ සිටි සමාජයේ ප්‍රතික්ෂේපයට පත්වූවන් නම් කොට ඔවුන් වෙනුවෙන් උන්වහන්සේ ඉටු කළ සේවය ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------

9. ''දියඹට ගොස් දැල්හෙලන්න'' යයි කළ ප්‍රකාශයට පේදුරුතුමා කීකරු වීම තුළින් ඉස්මතු වන වැදගත් තුනක් ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------

10. මාර්තා සහ මරියාගේ නිවසේ දී ජේසුස් වහන්සේ මරියා යහපත් දේ තෝරාගෙන ඇතැයි ප්‍රකාශ කළ සේක. මෙලෙස **යහපත් දේ** යනු කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------

11. 'ආබ්‍රහම්ගේ දියණිය' හා 'ආබ්‍රහම්ගේ පුත්‍රයා' යන නාම ලැබුණේ කාහටද?

-----------------------------------------------------------------------------------------------------------

12. පරිසිවරුන්ගේ ක්‍රියා කලාපය පිළිබඳව කරුණු තුනක් ලියා දක්වන්න.

-----------------------------------------------------------------------------------------------------------

13. ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු වූ අයකැමියෙකු නම් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------

14. ජේසුස් වහන්සේගේ ගෝලයෝ සබත් දින කරල් පොඩි කරගෙන කෑම නොකටයුත්තක් ලෙස විවේචනය කළ පරිසිවරුන්ට ජේසුස් වහන්සේ ලබා දුන් පිළිතුර ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------

15. සද්දුසිවරු පිළිබඳව විශේෂ කරුණු තුනක් ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------

16. ජේසුස් වහන්සේ ජනයාගේ හරසර මැද රාජ තේජසින් ජෙරුසලමට පිවිස වෙළඳුන් පලවා හරිමින් කළ ප්‍රකාශය ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------

17. සද්දුසිවරු ජේසුස් වහන්සේගේ අධිකාරිය බලය පිළිබඳ ප්‍රශ්න කිරීමට යොමු වූ විශේෂ සිදුවීම කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------

18. සද්දුසිවරුන්ගේ දරදඬු සිත් වලට ස්වාමින් වහන්සේගේ මෙහෙවර පසක් කර දීමට ජේසුස් වහන්සේ යොදාගත් උපමාව නම් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------

19. 'අප සීසර් අධිරාජ්‍යයාට බදු ගෙවිය යුතුද? නැද්ද? යනුවෙන් නැගූ පැනයට ජේසුස් වහන්සේ දුන් පිළිතුර ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------

20. ජුදෙව් ජනතාව විසින් ගෙවන ලද බදු වර්ග දෙක නම් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------

21. ජේසුස් වහන්සේ රාජතේජසින් ජෙරුසලමට පිවිසීම පිළිබඳව දිවැස්වැකි පැවසූ දිවැසිවරයා නම් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------

22. ජුදස් විසින් ජේසුස් වහන්සේ පාවා දුන් මුදල් ප්‍රමාණය කොපමණද?

-----------------------------------------------------------------------------------------------------------

23. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේ වැඩම කළේ කිනම් ස්ථානයකටද?

-----------------------------------------------------------------------------------------------------------

24. ආණ්ඩුකාරයා ඉදිරියෙහි ජේසුස් වහන්සේට එල්ල වූ චෝදනා තුන ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------

25. ජේසුස් වහන්සේ කුරුසියේ ඇණගැසූ ස්ථානය නම් කරන්න.

----------------------------------------------------------------------------------------------------

26. පේදුරුගේ මහා ප්‍රකාශය ලියන්න.

----------------------------------------------------------------------------------------------------

27. 'යළිත් ඔබ හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යමත් කරන්න' යැයි ජේසුස් වහන්සේ කළ ප්‍රකාශයට පේදුරුතුමා දුන් පිළිතුර ලියන්න.

----------------------------------------------------------------------------------------------------

28. ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට උපකාර වූයේ කවුරුන්දැයි නම් කරන්න.

----------------------------------------------------------------------------------------------------

29. පසුතැවුන සොරා ජේසුස් වහන්සේගෙන් කළ ඉල්ලීම හා ඊට ජේසුස් වහන්සේ දුන් පිළිතුර ලියා දක්වන්න.

----------------------------------------------------------------------------------------------------

30. අරමාතියේ ජෝසප් කළ යහපත් ක්‍රියාව කුමක්ද?

----------------------------------------------------------------------------------------------------

**ප්‍රශ්න පත්‍ර 2**

**පිළිතුරු පත්‍රය**

1. ජෙරුසලම් දේව මාලිගාව
2. එළියා දිවැසිවරයාව පෝෂණය කිරීමට දෙවියන් වහන්සේ ෂාරපෙත්හී වැන්දඹුව තෝරාගැනීම.

   එළිෂා දිවැසිවරයාගෙන් සුවය ලැබීමට නාමන් නම් අන්‍ය ජාතික සේනාධිපති තුමා තෝරා ගනු ලැබීම.
3. වෙද තුමාණෙනි ඔබ ඔබම සුව කරගන්න / ගමේ දිවැසිවරයා ගමට අගේ නැත.
4. ගෙනසෙරෙත් විල / තිබේරියස් මුහුද / ගලීල මුහුද
5. ගලීල මුහුද - පේදුරු ,ජාකෝබ්, ජොහාන් , අන්දෘ
6. විශේෂ කාර්යයක් සඳහා පුහුණු කර යවනු ලැබූවන්
7. යක්ෂයාගේ බලය හා සියලු ආධිපත්‍යය කෙරෙහි බලය පැවරුම් ලැබ රෝග සුව කිරීමේ වරම සහිතව දේව රාජ්‍ය ප්‍රකාශ කිරීම.

   සේවකයන් ඉල්ලා යාච්ඤා කරන්න.

   නිවෙස් වලට සාමය පතන්න.

   රෝගීන් සුව කරන්න.

   දෙවියන් වහන්සේගේ රාජ්‍යය පැමිණ තිබෙන බව දන්වන්න.
8. අන්‍ය ජාතීන් /රෝගීන් /වහලුන් /කාන්තාවන් /අයකැමියන්

   ජේසුස් වහන්සේ අන්‍ය ජාතීන් අගය කොට සැලකූ සේක

   රෝගීන් සුව කරමින් ඔවුන්ට සහනයක් වූ සේක

   කාන්තාවන් තම සේවය සඳහා පිළිගනිමින් කටයුතු කළ සේක
9. පේදුරුතුමා ඉතා අත්දැකීම් සහිත ධීවරයෙකු වුවද ජේසුස් වහන්සේට කීකරු වීම.

   එතුමා යේසුස් වහන්සේට ශුද්ධවන්තකම හා දේවත්වය අත්දැකීම හා වටහා ගැනීම.

   එසේ කීකරුවෙමින් තම ජීවිතයේ වෙනසක් ඇති කරගනිමින් සේවය සඳහා අනුගත වීම.
10. දේව වචනයට සවන් දීම.
11. කුදු ස්ත්‍රිය / සාකෙවුස්
12. යුදෙව් ප්‍රධානීන් ලෙස වැජඹුණි

    ටෝරාවේ අභ්‍යන්තර හරය ගැඹුරින් හැදෑරීම වෙනුවට එම නීතිවල බාහිර ස්වරූපය ඉස්මතු කරමින් ඒවා

සෘජු ලෙස පිළිපැදීමට යුහුසුළු විය

නිතිය අකුරටම පිළිපැදීමට සාමාන්‍ය ජනතාව පීඩාකාරී ලෙස යොමු කළහ.

තමන් ආගමික චාරිත්‍ර හා නීති රීති ඉතා පරිස්සමෙන් ආරක්ෂා කරන බව පෙන්නුම් කළහ

මංසන්ධිවල ප්‍රසිද්ධියේ යාච්ඤා කළහ

ඔවුන්ගේ වස්ත්‍රවල පවා ශුද්ධ ලියවිලි පාඨ ලියා තිබුණි

දන් දීමේදී ඔවුහු හොරණෑ නාදයෙන් එය ප්‍රචලිත කළහ

13. මතෙව් නොහොත් ලෙවි

14. දාවිත් රජු තමන්ටද සිය පිරිවරටද බඩගිනි වූ විට කළ දේ එනම් දෙවියන් වහන්සේගේ ගෘහයට ඇතුළුව පූජකයන් මිස අන් කෙනෙකුන් අනුභව නොකළ යුතු පිදූ රොටි කා සිය පිරිවරටත් දුන් පුවත ඔබ කියවා නැද්ද

15. සැඩොක් නමැත්තාගෙන් පැවත එයි / ලිඛිත දේ පමණක් විශ්වාස කළහ / දේවදූතයන් හා නැවත නැගිටීම. පිළිබඳව විශ්වාස නොකළහ

16. මාගේ ගෘහය යාච්ඤාවේ ගෘහයක් යයි ලියා ඇත. එහෙත් ඔබ එය හොරුන්ගේ ගුහාවක් කර ඇත.

17. ජේසුස් වහන්සේ රාජ තේජසින් ජිරුසලමට පිවිසීමේ සිදුවීම.

18. මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාව

19. සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්න.

20. රෝම රජයට බදු ගෙවීම ,දේව මාලිගාවට බදු ගෙවීම.

21. සෙකරියා දිව්‍යසිවරයා

22. රිදී මිල (30) තිහකට

23. ගෙත්සෙමන උයනට

24. ජාතිය කැරලි ගැසීමට පෙළඹවීම.

අධිරාජ්‍යයාට බදු ගෙවීම තහනම් කිරීම.

තමා ක්‍රිස්තුස් නම් රජෙකු යැයි ප්‍රකාශ කිරීම.

25. කල්වරි කන්ද / කපාල පිටිය

26. ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය

27. උන්වහන්සේ වෙනුවෙන් මරණයට වුවද මුහුණ දීමට සූදානම්ව සිටින බවය

28. කිරේණියේ සීමොන්

29. ඔබ අදම මා සමඟ පාරාදීසේ සිටින්නෙහිය

30. ජේසුස් වහන්සේගේ මෘත දේහය පිලාත්ගෙන් ඉල්ලීමට තරම් එඩිතර විය.

එම මෘත දේහය හණ රෙදි වලින් වෙලා කිසිවකු නො තැබූ කනින ලද සොහොනක තැන්පත් කිරීමට භාර ගැනීමට ඉදිරිපත් විය.